<u>දකුණු පළාත් සභාව</u>

# <u>2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

**<u>2025 වර්ෂය සඳහා දකුණු පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතනවලට අවශ්‍ය, ද්‍රව්‍ය, උපකරණ සහ සේවාවන් සැපයීම හා ඉදිකිරීම් සඳහා ලියාපදිංචි වීමට කැමැති රාජ්‍ය සංස්ථා/ රජයට පවරාගත් වෙළඳ ආයතන/ පෞද්ගලික ව්‍යාපාර/ සැපයුම්කරුවන්/ නිෂ්පාදකයින් /බෙදාහරින්නන් සහ ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.</u>**

## 01). කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

**සුදුසුකම්**

I). දකුණු පළාතේ ස්ථිර පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට සහ පළාත තුළ ස්වකීය ව්‍යාපාර හෝ ශාඛා ආයතන පවත්වාගෙන යන කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි විය හැකි අතර **"ඉදිකිරීම් සඳහා සෑම කොන්ත්‍රාත්කරුවෙක්ම <u>ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)"</u>** ආයතනයේ ලියාපදිංචි වී සිටිය යුතුය.(අයදුම්පත්‍රය සමග ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

## 02). සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

**සුදුසුකම්**

I.) 2025 වර්ෂය සඳහා දකුණු පළාත් සභාවේ රාජ්‍ය ආයතන සඳහා ද්‍රව්‍ය, උපකරණ , සැපයුම් හා සේවාවන් සැපයීම සඳහා ව්‍යාපාර පවත්වාගෙන යන සැපයුම්කරුවන්ට ඒ සඳහා ලියාපදිංචි විය හැකි අතර, ව්‍යාපාරය ලියාපදිංචිකර තිබිය යුතුය. (අයදුම්පත්‍රය සමග ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

II.) ඔබ ගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු විශේෂ බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් වේ නම්, එම බලපත්‍රය, අවසර පත්‍රය හෝ ලියාපදිංචි සහතිකය අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

III.) ආපන ශාලා පවත්වාගෙන යාම සඳහා මහ නගර සභා බල ප්‍රදේශයක නම්, ආහාර පනතට අනුකූලව කටයුතු කරන බවට මහජන සෞඛ්‍ය පරීක්ෂක ගේ සහතිකය ද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ගේ සහතිකය ද තිබිය යුතුය. (අයදුම්පත්‍රය සමග පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

IV). සැපයුම් හා සේවා ඇණවුම් සැපයීමට අවශ්‍ය මූල්‍යමය හා අනෙකුත් හැකියාවන් ඇති බවට ලිඛිත සාක්ෂි සැපයිය යුතුය.

V.) වැට් බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇත්නම්, ඊට අදාළ ලියකියවිලිවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

VI.) දකුණු පළාත් සභාවට අයත් සියලුම ආයතන මෙම සැපයුම්කරුවන් ලියාපදංචි ලේඛනය භාවිතා කර භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සිදු කරන බැවින්, අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර එවිය යුතුය.

VII) දැනට ලියාපදිංචි සැපයුම්කරුවන් සඳහා ඉහත සහතිකවල පිටපත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර, දැනට ලියාපදිංචි සැපයුම්කරුවන් වෙනුවෙන් ඇති අයදුම්පත හා මුදල් ගෙවූ ලදුපතෙහි මුල් පිටපත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

**03.) අයදුම්කිරීම හා ලියාපදිංචි කිරීම.**

I.) නිසි පරිදි සකස් කරන ලද අයදුම්පත් **2024.08.30 දින සිට 2024.11.15** දින දක්වා දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට භාරදිය යුතුය. එක් ව්‍යාපාරයක්/ ආයතනයක් සඳහා එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත්කළ යුතු අතර එක් අයදුම්පත්‍රයක් මගින් **අයිතම ඕනෑම ප්‍රමාණයක් ඉදිරිපත්කළ හැකිය**. එක් අයිතමයක් සඳහා ලියාපදිංචි ගාස්තු රු: 300/- ක් බැගින් ගෙවිය යුතු අතර, එය **ප්‍රධාන ලේකම්, දකුණු පළාත** නමින්, ප්‍රධාන ලේකම් කාර්යාලයේ සරප් වෙත හෝ දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දකුණු පළාත් සභාවට අයත් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තුවකට (දකුණු පළාත් සභාව නමින් ලදුපතක් නිකුත් කළ හැකි රජයේ පළාත් සභා ආයතනයකට) ගෙවා, ලදුපතක් ලබා ගත යුතුය. **එම ලදුපතෙහි මුල් පිටපත අයදුම්පත්‍රය සමග එවිය යුතුය.** නැතහොත් ලියාපදිංචි ගාස්තු, ප්‍රධාන ලේකම් නමින් ලංකා බැංකුව, ගාල්ල, කොටුව ශාඛාවෙහි ඇති ගිණුම් අංක **1587305** දරණ ගිණුමට බැරකර රිසිට් පත අයදුම්පත්‍රය සමග එවිය යුතුය.

II.) කොන්ත්‍රාත්කරුවන් සඳහා ලියාපදිංචි ගාස්තු පහත පරිදි ගෙවිය යුතුය.

(අ) කොන්ත්‍රාත් සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය **CIDA** ලියාපදිංචි හා ලියාපදිංචි ගාස්තු ප්‍රමාණයන් ;

1. රු: මිලියන 02 ට අඩු කොන්ත්‍රාත් සඳහා (C 9 සහ C 8 ) - රු: 1,000.00
2. රු: මිලියන 02 සිට රු : මිලියන 05 දක්වා (C 8 සහ C 7) - රු: 1,000.00
3. රු: මිලියන 05 සිට රු: මිලියන 10 දක්වා (C 7 සහ C 6) - රු: 2,000.00
4. රු: මිලියන 10 සිට රු: මිලියන 20 දක්වා (C 6 සහ C 5) - රු: 2,000.00

(ආ) මෙයට අමතරව ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සේවා අයිතමයක් සඳහා රු:300/- බැගින් ගෙවිය යුතුය.

III.) **sr.sys.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන්, 2025 සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය පිළිබඳ අයදුම්කරුවන්ට අවශ්‍ය තොරතුරු හා අයදුම්පත්‍රය ලබා ගැනීමට සහ online ක්‍රමය ඔස්සේ ද ලියාපදිංචි විය හැකිය.**

IV.) අයදුම්පත්‍ර හා මුදල් ගෙවීම පිලිබඳ විස්තර (බැංකු රිසිට්පත හෝ කුවිතාන්සිය) **2024.11.15** වැනි දින ප.ව: 3.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **ගණකාධිකාරී (සැපයුම්), ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච් දහනායක මාවත, ගාල්ල** යන ලිපිනයට එවීම හෝ අතින් ගෙනැවිත් **ගණකාධිකාරී (සැපයුම්)** වෙත භාර දීම හෝ procurementplan1@gmail.com යන විද්‍යුත් තැපෑලට ලියාපදිංචි අයදුම්පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

V.) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"2025 සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**වෙනත් කොන්දේසි :-**

01. මිල ගණන් කැඳවීම, ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කරනු ලබන අතර දකුණු පළාත් සභාවේ අවශ්‍යතාවය අනුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

02. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත්‍රය සලකා බලා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වෙත ඇති හැකියාවන් සහ සුදුසුකම් මත පමණක් එකී අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය හා හේතුන් නො දන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතුය.

03. යම් සැපයුම්කරුවෙකු ගේ/ කොන්ත්‍රාත්කරුවෙකු ගේ සේවය සැපයීම පිළිගත නො හැකි මට්ටමට දුර්වල තත්ත්වයක පවතින්නේ නම් හෝ සැපයුම්/ කොන්ත්‍රාත් කටයුතු කිරීමේ දී යම් වංචාසහගත ක්‍රියාවක් හෝ අක්‍රමිකතාවයක යෙදුන බවට තහවුරු වුවහොත්, එම ආයතන අසාධු ලේඛනයට ඇතුළත්කොට, මින් ඉදිරියට සැපයුම්කරුවකු/ කොන්ත්‍රාත්කරුවෙකු ලෙස පිළිනොගැනීමට කටයුතු කළ හැකිය. ඒ පිළිබඳ වූ පූර්ණ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතු වන්නේය.

04. ව්‍යාජ ලියවිලි ඉදිරිපත් කරමින් භාණ්ඩ සැපයීමක් සඳහා හෝ සේවාවන් සඳහා ලියාපදිංචි වන ආයතන හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් දැඩි නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

05. සියලුම අයදුම්කරුවන් සුදුසුකම්, හැකියාවන් හා යෝග්‍යතාවයන් සපුරා ඇතැයි යන උපකල්පනය මත, ලියාපදිංචිය සිදු කරනු ලබන අතර එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලියන්හි දී සුදුසුකම් සපුරා නොමැති සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ප්‍රතික්ප කරනු ලැබේ.

06. දකුණු පළාත් සභාවේ ආයතන විසින් ඉදිරියේ දි සිදු කරන ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය (E-GP) අනුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බැවින් සියලු සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් විසින් අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ (promise.lk) ලියාපදිංචි වීම අත්‍යාවශ්‍යය වේ. www.promise.lk වෙත පිවිසීමෙන් මෙම පද්ධතිය සඳහා ලියාපදිංචි විය හැක.

07. ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් වෙතොත්, 091- 4946368/ 091- 4944016/ දුරකථන අංක ඇමතීමෙන් හා procurementplan1@gmail.com යන විද්‍යුත් තැපැල මගින් විස්තර ලබා ගත හැකිය.

**සුමිත් අලහකෝන්**
**ප්‍රධාන ලේකම්,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**එස්.එච් දහනායක මාවත,**
**ගාල්ල.**
**දිනය :- 2024.08.**